## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව - 2015

---

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන
------------------

### 2.1 මතය
---------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති
-----------------------------------

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.94,841,186 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්
-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී මාසික විකුණුම් ඉලක්ක සම්පූර්ණ කිරීමට අපොහොසත්වූ බෙදාහරින්නන් දෙදෙනෙකුගෙන් ආපසු අයකර ගත යුතු රු.90,933 ක වට්ටම් 2016 මාර්තු 16 වන විටත් අයකර ගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි.

(ආ) 2010 වර්ෂයට අදාල එකතු කළ අගය මත බදු රු.633,049 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

### 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු
------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දේශීය හා විදේශීය සමාගම් සමඟ හවුල් සහයෝගීතාවලට එළඹීමේ ප්‍රතිපත්තිමය තීරණය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 5 කදී හවුල් සහයෝගීතාවලට එළඹීමේ මූලික කටයුතු ආරම්භකර ඒ සඳහා රු.115,000 ක වෘත්තීය ගාස්තු ගෙවා තිබුණි.

(ආ) අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී පිරිවැය රු.8,048,368 ක් වූ ජංගම නොවන වත්කම් අපහරණය කර තිබුණි.

### 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්
--------------------------------------------------------------------------

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත පරිදි විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 371 2 (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ නිකුත් කර තිබුණු එකතුව රු.247,403 ක්වූ අතුරු අග්‍රිම 03 ක් මාස 01 ත් මාස 11ත් අතර කාලයක් ප්‍රමාද වී පියවා තිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 571 (2) | සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවති තැන්පත් කල දින සිට වර්ෂ 2 ඉක්මවා තිබූ එකතුව රු.2,238,121 ක ලංසු බැඳුම්කර නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1 (ආ) ඡේදය වෙනුවෙන් 2010 සැප්තැම්බර් 06 දින පළකර තිබූ 19 වන අතිරේකය | මෝටර් වාහන අලුත්වැඩියා වියදම රු.200,000 ඉක්මවන විට ඒ සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් ඊට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළදී වාහනයක් අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.279,087 ක් වැයකර තිබුණි. |
| (ඇ) | සුළු සේවකයින් බඳවාගැනීමේ පරිපාටිය | පුවත්පත් දැන්වීම් පළකිරීමෙන් තනතුරු පුරප්පාඩු ප්‍රසිද්ධ කර සම්මුඛ පරීක්ෂණ පවත්වා සුදුසුකම් සඳහා ලකුණු දීමෙන් තෝරාගත් පුද්ගලයින් බඳවා ගත යුතු වුවත් එයට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළදී සුළු සේවකයින් 13 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. |
| (ඈ) | විධායක නොවන සේවකයින් බඳවාගැනීමේ පරිපාටිය | පුවත්පත් දැන්වීම් පළකිරීමෙන් තනතුරු පුරප්පාඩු ප්‍රසිද්ධ කර ලිඛිත විභාගයක් හා සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුසුකම් සඳහා ලකුණු දීමෙන් තෝරාගත් පුද්ගලයින් බඳවා ගත යුතු වුවත් එයට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළදී අයකැමි තනතුරට කොන්ත්‍රාත් පදනම මත පුද්ගලයෙක් බඳවා ගෙන තිබුණි. |
| (ඉ) | 2009 මාර්තු 09 දිනැති අංක ඩීඑම්එස්/ඊ4/10/4/090/2 දරන සෞඛ්‍ය ලේකම් ඇමතූ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය | |
| | (i) ඡේද අංක 02-01 | ලිපියේ විධිවිධානවලට අනුකූල නොවන පරිදි සංස්ථාවේ විධායක හා විධායක නොවන නිලධාරීන් වෙත දුර ප්‍රමාණය නොසළකා 2009 වර්ෂයේ සිට මාසිකව පිළිවෙලින් රු.4,700 ක හා රු.3,000 ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. |
| | (ii) ඡේද අංක 02-02 | ලිපිය ප්‍රකාරව කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත මාසික නිෂ්පාදන දිරි දීමනාවක් ලෙස රු.4,000 ක් පමණක් ගෙවිය හැකි වුවත් ඊට අනුකූල නොවන පරිදි 2011 ජූලි |

01 දින සිට මාසික උපරිමය රු.12,000 කට යටත්ව සමස්ත කාර්ය මණ්ඩලය වෙත නිෂ්පාදන දිරි දීමනා ගෙවා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.12,292,265 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි.

| | | |
|---|---|---|
| (ඊ) | 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) රජයේ ආයතනවල ගොඩගැසී ඇති අපහරණය කළ යුතු භාණ්ඩ කඩිනමින් අපහරණය කළ යුතු වුවත් 2015 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද හා උපයෝජනය කළ නොහැකි පිරිවැය රු.50,103,387 ක ජංගම නොවන වත්කම් අපහරණය කර නොතිබුණි.<br><br>(ii) 2015 දෙසැම්බර් 31 දින වන විට භාවිතයට ගත නොහැකි මුළු පිරිවැය රු.15,262,967 ක්වූ අමුද්‍රව්‍ය තොග හා මුළු පිරිවැය රු.1,820,250 ක් වූ ඇසුරුම් ද්‍රව්‍ය ගබඩාවල තබා තිබුණු නමුත් ඒවා විධිමත් ලෙස අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.262,323,747 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.183,848,683 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.78,475,064 ක එනම් සියයට 43ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. විකුණුම් පිරිවැය රු.216,092,507 කින් හා බදු වියදම රු.69,544,789 කින් වැඩිවී තිබුණද විකුණුම් ආදායම රු.342,257,122 කින් වැඩිවී තිබීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.
සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අඛන්ඩ මූල්‍ය අතිරික්තයක් පෙන්නුම් කළද එය වාර්ෂිකව උච්චාවචනය වී තිබුණි. සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී සංස්ථාවේ 2011 වර්ෂයේදී රු.551,241,277 ක්වූ දායකත්වය 2015 වර්ෂයේදී රු.814,843,103 ක් දක්වා සියයට 6 සිට සියයට 49 අතර උච්චාවචනයන් සහිතව වර්ධනයවී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය.**

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ජංගම අනුපාතය පිළිවෙලින් 9:1 ක් හා 11:1 ක් ලෙසද ක්ෂණික අනුපාතය පිළිවෙලින් 5:1 ක් හා 8:1 ක් ලෙසද පැවති බැවින් අතිරික්ත කාරක ප්‍රාග්ධනය ඵලදායී ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**4. මෙහෙයුම් සමාලෝචනය.**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1987 ජුනි 04 දිනැති අංක 456/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍රය ප්‍රකාරව ඖෂධ නිෂ්පාදනය, සැකසීම, ගබඩා කිරීම, ඇසිරීම සහ නැවත ඇසිරීම, ඖෂධ නිෂ්පාදනයට සහ සැකසීමට අවශ්‍ය තාක්ෂණික සහාය සැපයීම, ඖෂධ විද්‍යා හා ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ හා ඖෂධ ප්‍රමිතිකරණය සහ නිෂ්පාදිත ඖෂධ අලෙවි කිරීම

සංස්ථාවේ ප්‍රධාන අරමුණු විය. ඒ අතරින් ඖෂධ විද්‍යා හා ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ හා ඖෂධ ප්‍රමිතිකරණය යනාදී අරමුණු ප්‍රමාණවත් ලෙස ඉටුකර ගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

(ආ) 2015 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණු ආකෘතිය ප්‍රකාරව ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණු බැවින් ප්‍රගතිය පිළිබඳ නිසි සමාලෝචනයක් කළ නොහැකි විය.

## 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලේබල් නැතිවීම නිසා වර්ගය හා පිරිවිතර හඳුනාගත නොහැකිවීම හේතුවෙන් ඖෂධ නිෂ්පාදනය සඳහා නිකුත්කළ නොහැකි වූ අමුද්‍රව්‍ය වර්ග දෙකක මුළු වටිනාකම රු.115,498 ක් සමාලෝචිත වර්ෂය තුළදී ලාභයට එරෙහිව කපාහැර තිබුණි. නමුත් ලේබල් නැතිවීම කෙරෙහි වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට හා ඔවුන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) අමුද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය සඳහා ප්‍රශස්ථ තොග මට්ටම් පවත්වා නොතිබීම හේතුවෙන් පරීක්ෂාවට භාජනය කරන ලද අමුද්‍රව්‍ය වර්ග 88 කින් අමුද්‍රව්‍ය වර්ග 8 ක තොග අවශ්‍යතා සියයට 84 සිට සියයට 270 අතර ප්‍රමාණයකින් ඉක්මවා තොග මිලදී ගෙන තිබුණු අතර ඇසුරුම් ද්‍රව්‍ය වර්ග දෙකක තොග ශුන්‍යව පැවතුණි. කල් ඉකුත්වූ තොග ප්‍රමාණය ඉහළයාමේ හා කාරක ප්‍රාග්ධන ඌනතා ඇතිවීමේ ප්‍රවණතාවයකට මෙන්ම නිෂ්පාදනය ප්‍රමාදවීමට හා හදිසි මිලදීගැනීම් සිදුවීම සඳහාද මෙම තත්ත්වය හේතුවිය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) අමුද්‍රව්‍ය, ඇසුරුම් ද්‍රව්‍ය හා පෙති ආවරණයන්වල තොග ඌනතාවයන් පැවතීම, ප්‍රමාණවත් යන්ත්‍ර ධාරිතාවයක් නොතිබීම, නිෂ්පාදන ක්‍රියාවලිය තුළ තාක්ෂණික දෝෂ පැවතීම ආදී වූ හේතූන් මත වෛද්‍ය සැපයුම් අංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඇණවුම් කර තිබුණු ඖෂධවලින් රු.447,494,529 ක් වටිනා ඖෂධ වර්ග 20 ක ඒකක මිලියන 710.06 ක් සමාලෝචිත වර්ෂය තුළදී සැපයීමට අපොහොසත්වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අලෙවි සැලැස්ම අනුව ඖෂධ වර්ග 84 ක ඒකක මිලියන 2,152 ක් වූ ඉලක්කගත අලෙවියෙන් ඖෂධ වර්ග 10 ක ඒකක මිලියන 354.19 ක ඉලක්කයක් සම්පූර්ණ කිරීමට නොහැකිවී තිබුණු බව ප්‍රගති වාර්තාවලින් තහවුරු විය.

(ඉ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව බෙදාහරින්නන් වෙත අලෙවි කරන ලද ඖෂධ වර්ග 16 ක අලෙවි ප්‍රමාණය සමාලෝචිත වර්ෂය තුළදී සියයට 7 සිට සියයට 75 දක්වා පරාසයකින් අඩුවී තිබුණි. ඒ හේතුවෙන් එම අලෙවි ආදායම රු.39,186,940 කින් හෙවත් සියයට 6.6 කින් අඩුවී තිබුණි.

(ඊ) වෛද්‍ය සැපයුම් අංශය වෙත ඖෂධ අලෙවියේදී පිරිවැයෙන් සියයට 12ක ලාභාන්තිකයක් සහිතව මිල නියම කිරීම ප්‍රතිපත්තිය වුවද, ඊට වඩා අඩු ලාභාන්තිකයක් සහිතව ඖෂධ වර්ග 13 ක මිල නියම කර අලෙවිකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් මාස 06 තුළදී පමණක් නියැදි පරීක්ෂාවට භාජනය කරන ලද ඖෂධ වර්ග 43 ක විකුණුම් ආදායම රු.1,929,118 කින් අහිමි වී තිබුණු බව අනාවරණය විය.

## 4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට සිදුකර තිබුණු භෞතික තොග සත්‍යාපනයේදී අනාවරණය වූ රු.851,978 ක තොග අතිරික්තතා හා රු.148,573 ක තොග ඌනතා සම්බන්ධයෙන් ගිණුම්වල ගැලපීම් කර තිබුණද ඒවා ඇතිවීමට හේතු හඳුනාගෙන පිළියම් යෙදීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ණයගැතියන්ගෙන් ණය එකතු කිරීමේ කාලය දින 16 ක් වුවද, දින 50 ක ණය කාලසීමාවක් ලබාදී තිබුණි. එම ණය කාලසීමාවද ඉක්මවා අවස්ථා 2 කදී රු.1,176,684ක ණය නිරවුල් කිරීමට ඉඩදී තිබුණු නමුත් ප්‍රමාද පොලී අයකිරීම සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි.

## 4.4 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේදී රු.512,295 ක් වැය කර මිලදී ගෙන තිබුණු “Saccharin Sodium” අමුද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 250න් කිලෝ ග්‍රෑම් 100 ක් කල් ඉකුත්වීමට ප්‍රථම පාවිච්චි නොකිරීම හේතුවෙන් සිදුවී තිබුණු අලාභය රු.239,156 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී සමහර ඖෂධ නිෂ්පාදනය අතහැර දැමීම නිසා ඒ සඳහා මිලදී ගත් අමුද්‍රව්‍ය භාවිතයෙන් ඉවත්වීම, කල් ඉකුත්වීමට ආසන්නව පැවති අමුද්‍රව්‍ය තත්ත්වයෙන් අසමත්වීම වැනි හේතු මත පාවිච්චියට නුසුදුසු යැයි හඳුනාගෙන තිබුණු අමුද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍යවල මුළු පිරිවැය රු.3,798,626 ක් ලාභයට එරෙහිව කපා හැර තිබුණි.

(ඇ) 2015 ජනවාරි 06 දින කොළඹ 07 ධර්මපාල මාවතේ ආරම්භ කර තිබුණු ඖෂධ තොග අලෙවිසැලේ මුළු අලාභය රු.985,113 ක් වූ අතර එය 2015 අප්‍රේල් මාසයේ සිට වසා දමා තිබුණි.

## 4.5 ප්‍රමාද වූ ව්‍යාපෘති

මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.400,000,000 ක්වූ ගොඩනැගිලි 03 ක් ඉදිකිරීමටත් සමාලෝචිත වර්ෂය තුළදී ඉන් රු.100,000,000 ක් වැයකිරීමටත් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු නමුත්, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව 2015 මැයි මාසය වන විට ඉදිකිරීම් වැඩ ආරම්භ කර තිබිය යුතු වුවද 2015 දෙසැම්බර් 31 දින වන විටත් ගොඩනැගිලි දෙකක් සඳහා උපදේශකවරුන් පත්කර ගැනීම පමණක් සිදුකර තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

2015 දෙසැම්බර් 31 දිනට විධායක තනතුරු 08 ක, විධායක නොවන තනතුරු 12 ක හා සුළු සේවක තනතුරු 02 ක පුරප්පාඩු පැවති නමුත් වෙනත් විධායක තනතුරු 01 ක්, විධායක නොවන තනතුරු 07 ක් හා සුළු සේවක තනතුරු 32 ක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 03 දෙනෙකු ස්ථිර පදනම මතද 37 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මතද බඳවාගෙන තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන සැලැස්මට ඇතුළත් කර තිබුණු මුළු වියදමින් සියයට 78 ක් ආවරණය වන ස්ථාවර වත්කම් හා අමුද්‍රව්‍ය මිලදී ගැනීම්වලට අදාළව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

එකිනෙක ප්‍රසම්පාදනයන් අවසන් කිරීමේ ඉලක්කගත දිනයන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් කර නොතිබුණු අතර ප්‍රසම්පාදන කාල සටහනද පිළියෙල කර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

අමුද්‍රව්‍ය වර්ග 18 ක ඇස්තමේන්තුගත ප්‍රමාණය ඉක්මවා සියයට 27 සිට සියයට 1400 දක්වා පරාසයක් තුළ මිලදී ගැනීම් සිදුකර තිබුණු බැවින් තාත්වික ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බවත්, සමස්ත වියදම් අයිතම 62 කින් වියදම් අයිතම 17 ක ඇස්තමේන්තුගත හා තත්‍ය වියදම අතර සියයට 50 සිට සියයට 167 දක්වා විචලනයන් පැවති බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ස්ථාවර වත්කම් පාලනය | වත්කම් අපහරණය සඳහා නිසි අනුමැතිය ලබාගෙන නොතිබීම හා වත්කම් අපහරණය කාර්යක්ෂමව නොකිරීම. |
| (ආ) තොග පාලනය | ප්‍රශස්ථ තොග මට්ටම් පවත්වා නොගැනීම හා තොග නිකුත් කිරීම් සටහන් නොකිරීම. |